# පින්තූර කතා



සිනේජා සමරකෝන්.

# පින්තූර කතා

**සිනේජා සමරකෝන්.**
**ISBN 978-624-206-858-9**

**කෘතිය පල කරන දිනය : 2023.11.15**

**කතෘගේ වෙනත් කෘති : දඟ මල්ලි**

**: තෑග්ග**

**: අපූරු හීනය**

# පිදුම

මගේ ආදරණීය
අත්තම්මා
සහ
ලොකු අත්තාටත්
ආදරණීය අම්මාට
සහ
අප්පච්චිටත්
මගේ චූටි මල්ලියාටත්,
ආදරණීය සමන්මලී
ගුරුතුමියටත්
ඉතා සෙනෙහසින් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැඟීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන් ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟ පෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන් ම කාලීන ජාතික අවශ්‍යතාවක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් **"දිවිය දිනන විද්‍යුත් පොතක් "** ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන් ම ගත්කතුවරයකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉතිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන් ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහමායා බාලිකා විද්‍යාලය මහනුවර
2023.11.01





1



කැරට් අලේ රස බලන්න
මම හරි ආසයි
දැක්ක ම ලොකු කැරට් අලේ
බඩගිනි වැඩිවෙයි



ඉගිලෙන්නේ මෙන්න
මෙහෙම
පුංචි පැටවුනේ
පරෙස්සමෙන් බලාගෙනයි
මගේ පැටවුනේ


පුංචි උණත්
මම
හරි
හපනෙක්
වියනවා
ලස්සන
මකුළු දැලක්



මාළු බාන්නට
යන්නට  මම හරි
කැමතියි අම්මේ
පරෙස්සමෙන් ගඟ
දිහාට  ගිහිල්ලා
එන්න ද අම්මේ ?


කන්ද උඩින් ඉර
මාමා
සිනා සලන්නේ
පිල් විදහා
මොනරහාමි
නැටුම් නටන්නේ


සමගි බලේ හොඳ ම
බලේ ලොවට
කියන්නේ පුංචි
වුණත් ලොකු තුඹසක්
අපිත් බඳින්නේ


රතට රතේ ඉර මාමා
බැසගෙන යන්නේ
බකුසුහාමි හොරා
වගේ
එළියට එන්නේ


බරට බරේ කද
බැදගෙන එළවළු
ටික විකුණා ගන්න
හා හාමි හනි
හනිකට පොළ
වෙත යන්නේ


ඔළුව කසා දත නියවා
නටමු ද යාලූ
මමත් එනවා ඔබ සමඟින්
නටන්න යාළු

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇති ව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැඟී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක් ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන් ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන් ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

" **දිවිය දිනන විද්‍යුත් පොතක්** " ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත් කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයකු වීමට ශක්තිය ලැබේවායි පතමි.

මෙයට<br>
සෙනවිරත්න මහලේකම්<br>
දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘති නිර්මාපක<br>
2023.11.01